## කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය – රාජගිරිය

## 05 වන බී. ඒ. එම්. එස්. වාර්ෂික පරීක්ෂණය – 2015 පෙබරවාරි

## ස්ත්‍රී රෝග

කාලය - පැය 03

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පෙ. ව. 9.00 – මධ්‍යාහ්න 12.00

01 i යෝනි ව්‍යාපද් නාම කරණය විවිධ ග්‍රන්ථ අනුව පැහැදිලිව දක්වන්න. (ලකුණු 06)

ii විනීතා ඉතා කාර්‍යය බහුල වයස 38 ක අවිවාහක කාන්තාවකි. මාස 02 ක සිට උදරයේ වම් පස වරින් වර ඇතිවන වේදනාව හා තද බව ඇයගේ ප්‍රධාන පැමිණිල්ල වේ. මේ තත්ත්වය අනුව වඩාත් සාධාරණ විනිශ්චයකට එළඹීම කෙසේ සිදුකරන්නේ දැයි පහදා ඒ සඳහා නියමිත ප්‍රතිකාර පද්ධතියක් දක්වන්න. (ලකුණු 14)

02 වයස අවුරුදු 55 ක් වූ දරුවන් 04 ක් ලද මවක් නිතර නිතර මූත්‍ර පිටවන බව පැමිණිලි කරයි.

i මැයගේ රෝග තත්ත්වයට අදාළ විවිධ රෝග විනිර්ණය දක්වා වඩා ගැලපෙන රෝග තත්ත්වය දක්වන්න. (ලකුණු 10)

ii නිර්ණය කරන රෝගයට යෙදිය හැකි ප්‍රතිකාර කවරේද ? (ලකුණු 10)

03 යෝනි මගින් සුදුපැහැ ස්‍රාවයක් පිටවන වයස අවුරුදු 30 ක අවිවාහක කාන්තාවක් ඔබ වෙත පැමිණෙයි.

i ඇයගේ රෝගය සම්බන්ධ සාපේක්ෂ විනිශ්චයන් මොනවාද ? (ලකුණු 06)

ii ස්ථිර විනිශ්චයකට එළඹීමට අවශ්‍යවන පරීක්ෂා කවරේ ද? (ලකුණු 06)

iii මෙබඳු අවස්ථාවකට ගැලපෙන ප්‍රතිකාර පද්ධතියක් දක්වන්න. (ලකුණු 08)

දේශීය පුස්තකාලය
වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්වවිද්‍යාලය
රාජගිරිය.

අනික් පිටුව බලන්න.

04 වයස අවුරුදු 38 ක් වයසැති විමලා විවාහක කාන්තාවකි. ඇයට මාස් ශුද්ධියේ දී අධික රුධිර වහනයක් වන අතර මාස්වීම් දෙකක් අතරමැද කාලයේදී ද මද වශයෙන් රුධිරය පිටවීමක් පැමිණිලි කරයි.

i මේ තත්ත්වයේදී ඔබ විසින් අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු මොනවාද ? (ලකුණු 05)

ii විවිධ රෝග විනිර්ණය හා එමගින් රෝග නිර්ණයට එළඹෙන අයුරු දක්වන්න.(ලකුණු 05)

iii රෝග නිර්ණය තහවුරු කර ගැනිම සඳහා ඔබ නිර්දේශ කරන වෛකෘත පරික්ෂණ මොනවාද ? (ලකුණු 02)

iv චිකිත්සා මූලධර්මය දක්වා, මෙම රෝග අවස්ථාව සඳහා භාවිතා කළ හැකි කෂාය 2 ක් වට්ටෝරු කරන්න. (ලකුණු 08)

05 කෙටි සටහන් ලියන්න.

i ස්ත්‍රී වයස් විවරණ

ii ආර්ථව චක්‍රය හා එහි ක්‍රියාව

iii ස්තන විද්‍රධි

iv ස්ත්‍රී මානසික රෝග

(ලකුණු 5 X 4 = 20)

**2015. 02. 18**